www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය 2005*

# සමාජවාදී සමානතා පක්ෂයට සහයෝගය දෙන්න

*යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව සමාජවාදී විකල්පය*

**Support the Socialist Equality Party in the 2005 Sri Lankan presidential election**
**The socialist alternative to war and social inequality**

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**
**2005 ඔක්තෝබර් 22**

නොවැම්බර් 17 දින පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ව්‍යායාමයට සහභාගීව ආධාර කරන මෙන් අපි කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන්, බුද්ධිමතුන්ගෙන් හා ගෘහනීන්ගෙන් ඉල්ලා සිටිමු.

අපගේ අපේක්ෂක විජේ ඩයස්, යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කර සටන් වදින එක ම අපේක්ෂකයා ය. 64 වියැති විජේ ඩයස්, සසප ප්‍රධාන ලේකම් මෙන් ම ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙක් ද වේ. ඔහු වනාහි සමාජවාදය උදෙසා ගෙන යන සප්‍රතිපත්තික අරගලය හරහා කම්කරු පන්තියේ විමුක්තිය සඳහා තම සමස්ත වැඩිහිටි ජීවිතය ම කැප කර ඇත්තෙකි.

සසප ව්‍යායාමයේ මුල්ගල වන්නේ ජාත්‍යන්තරවාදය යි. සසප ඉදිරිපත්ව සිටින්නේ හුදෙක් ශ්‍රී ලංකාව තුල ඡන්ද දිනා ගැනීමට නො ව, ඉන්දියානු උප-මහාද්වීපය පුරා කම්කරුවන් සමාජවාදී ක්‍රියා මාර්ගයක් හා ඉදිරි දර්ශනයක් මත පදනම් වීමේ අවශ්‍යතාව පිලිබඳ සාකච්ඡාවකට මුල පිරීම සඳහා ය. ගෝලීය ප්‍රාග්ධනයේ කොල්ලකාරී ක්‍රියාකාරකම්වලට එරෙහිව සටන් වැදීම සඳහා කම්කරු පන්තියට, තම පන්තියේ ම ජාත්‍යන්තර මූලෝපායක් තිබිය යුතු ය. එය වනාහි අතලොස්සකගේ ලාභ ගැරිල්ල සඳහා නො ව බහුතරයේ සමාජ අවශ්‍යතාව සඳහා ලෝක ආර්ථිකය සමාජවාදී පිලිවෙත් ඔස්සේ ප්‍රතිසංවිධානය කිරීම ය.

කම්කරු පන්තිය මුහුන දී සිටින ගැටලුවලින් එකක් වත් මෙම කුඩා දිවයිනේ හෝ වෙනත් ඕනෑ ම තනි ජාතික රාජ්‍යයක දේශ සීමා තුල විසඳා ලිය නොහැක්කේ ම ය. වැඩ කරන ජනතාවට පාලක පන්තියේ මොන ම පක්ෂයක් කෙරේ හෝ විශ්වාස මාත්‍රයක් වත් තබා ගත නොහැකි ය. ගත වූ ශතවර්ෂයේ අවසාන භාගය මුලුල්ලේ ම ශ්‍රී ලංකාවේ ද ඉන්දියානු උප-මහාද්වීපය පුරා ම ද හැම දේශපාලන පාටක ම ආන්ඩු ඔප්පු කර තිබෙන්නේ මහජනතාවගේ ඉතා ම මූලික අවශ්‍යතාවන්ට හා අපේක්ෂාවන්ට ආමන්ත්‍රනය කිරීමට ඔවුන්ගේ ඇති අසමත්කම ය.

දෙසැම්බර් 26 සුනාමිය කෙරෙහි නිල ප්‍රතිචාරය ද වඩාත් ම මෑත දී, උතුරු පකිස්ථානයේ හා ඉන්දියාවේ සිදු වී තිබෙන දරුණු භූමිකම්පාව කෙරෙහි දක්වා ඇති නිල ප්‍රතිචාරය ද කලාපයේ දිලිඳු ජනතාව වැටී සිටින තත්වය පිලිබඳව පාලක කවයන් තුල පවත්නා සාර්වත්‍රික නොතැකීම එලිදරව් කර තිබේ. ඉන්දුනීසියාවේ, ශ්‍රී ලංකාවේ, ඉන්දියාවේ සහ තායිලන්තයේ ලක්ෂ තුනකට අධික ජනකායක් මරුමුවට පත් කරමින් මහ රල පහර නගර ගම් පිටින් සෝදා හරිමින් දිව ගොස් දස මසකටත් පසු, ඉතිරි වූ බොහෝ දෙනා තව මත් යන්තම් පන ගැට ගසා ගෙන සිටින්නේ කුනු ගඳ ගසන තාවකාලික නිවහන්වල ය. ජනවාරි මස ජකර්තා සමුලුවේ දී පොරොන්දු වූ ඩොලර් බිලියන 4ක ජාත්‍යන්තර ආධාරවලින් වැඩි හරියක් ව්‍යසනයට ගොදුරු වූ අයට නම් තව මත් ලැබී නැත.

මීට නොවෙනස් ලෙස ම, ඔක්තෝබර් 8 දා යෝධ භූකම්පනය ඇති කලේ කොයි මොහොතේ පුපුරා යා දැයි පෙර තියා කිව නොහැකි භූගර්භගත බලවේග විසින් වුවත් ඉන් ඇති වූ, 40,000කට අධික සංඛ්‍යාවක් මරනයට පත් කල හා මිලියන 2.5කට උන්හිටි තැන් නැති කල භයංකර සමාජ ප්‍රතිවිපාක නම් සියල්ලට මත් වඩා ඉහලින් ලාභ ගැරිල්ල තියන්නා වූ ධනේශ්වර ආර්ථික පර්යායේ නිර්මානයකි. මනාව තැනුනු නිවාස, මංමාවත් සහ යටිතල පහසුකම් නැති වීම වනාහි, ප්‍රධාන අධිරාජ්‍යවාදී රටවල ධනවත්, ගනනින් ඉතා කුඩා ප්‍රභූ ස්ථරයකට අධිලාභ සම්පාදනය කිරීම සඳහා, ආසියාවේ, අප්‍රිකාවේ සහ අන් සෑම තැනක ම පීඩිත රටවල ලාභ ශ්‍රමය සහ සම්පත් ක්‍රමානුකූලව සූරා කෑමේ අනිවාර්ය ප්‍රතිඵලය යි.

වොෂිංටනයේ, ලන්ඩනයේ, ටෝකියෝවේ සහ බර්ලිනයේ ප්‍රධාන පූර්වෝපාත්සුකය වී ඇත්තේ භූමිකම්පාවට හෝ සුනාමියට හෝ ගොදුරු වූවන්ගේ තත්වය නො වේ, ඉන් මූල්‍ය වෙළඳ පොලවල් කෙරෙහි ඇති විය හැකි බලපෑම් ද දේශපාලන අස්ථාවර භාවය ද පිලිබඳව ය. මහ බලවතුන්ගෙන් ආධාර පිලිබඳව ලැබී ඇති පොරොන්දුවල එල්ලය වී ඇත්තේ ප්‍රදේශයේ පාලන තන්ත්‍රවලට මුක්කු ගැසීම ද මෙම ප්‍රදේශ තුල තමන්ගේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා වගා කර ගැනීම ද වේ. එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් සුනාමිය විස්තර කලේ," ඇමරිකානු ජනතාවගේ හදවත් විදහා දක්වීමට" මහගු අවස්ථාවක්" ලෙස ය. සුනාමිය "අපට විශාල වාසි පංගුවක් අත් කර දී ඇත" යැයි ඇය කියා සිටියා ය.

එක්සත් ජනපදයේ දකුනු ප්‍රදේශය හරහා කැත්‍රිනා චන්ඩ මාරුතය හමා යද්දී දකුනු ආසියාවේ දුප්පත් ජනතාව කෙරෙහි තමන් දැක්වූ පිලිකුල ම නිව් ඕර්ලියන්ස්හි වැඩ කරන ජනතාව කෙරෙහි ද දැක්වූ බුෂ් පාලනාධිකාරය එමගින් ද තමන්ගේ" හදවත" ප්‍රදර්ශනය කලේ ය. මේ මහා ව්‍යසනය විසින් ඇමරිකානු ධනවාදයේ වෙස් මුහුන ගලවා දමමින් වෙලඳ පොල නිදල්ලේ ක්‍රියාත්මක වූ දශක ගනනාවක් මගින් නිර්මිත සමාජ කුනු වීම එලිදරව් කරන ලද්දේ ය. එය වනාහි ධනපතීන් හා දුප්පතුන් අතර අපාර භේදයකි, දිරාපත් වන්නා වූ යටිතල පහසුකම් ය, මූලික සේවාවන් පවා නොපැවතීම ය. නිව් ඕර්ලියන්ස් වේවා, කොලඹ වේවා, නව දිල්ලියේ වේවා කම්කරුවෝ වත්මන් බංකොලොත් සමාජ පර්යාය පෙරලා දමා තමන්ගේ අවශ්‍යතාවන් හා අපේක්ෂාවන් දිනා ගත හැකි සමාජ පර්යායක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාව පොදුවේ දරා සිටිති.

උප-මහාද්වීපය හරහා වැඩ කරන ජනතාවගේ ඒකාබද්ධ අරගලයක් උදෙසා සාරභූත පූර්ව කොන්දේසිය නම් පාලක පන්තීන් තම වරප්‍රසාදිත තත්වය පවත්වා ගෙන යාම සඳහා රටවල් අතර සහ රටවල් ඇතුලත කම්කරුවාට එරෙහිව කම්කරුවා පිහිටුවමින් අවුලුවා ලන සකල රූපාකාර වර්ගවාදය ද ප්‍රජාගනවාදය ද ජාතිකවාදය ද ප්‍රතික්ෂේප කිරීම ය. වර්ගවාදය නමැති විෂ ශ්‍රී ලංකාවේ දී තරම් දුෂ්ට ක්‍රියා කලාපයක් අන් කවර තැනක දී වත් ඉටු කර නැත, එය මේ රට තුල 60,000ක් ජනයාගේ ජීවිත විනාශ කොට, ගනන් නැති දහස් ගනනකගේ අත්පා බිඳ හෝ උන්හිටි තැන් නැති කර දමා දිවයිනේ විශාල ප්‍රදේශයක ඉඩකඩම් විනාශ කර දැම්මේ ය.

ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙකේ ජනාධිපති අපේක්ෂකයෝ -- ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) අගමැති මහින්ද රාජපක්ෂ සහ විපක්ෂ නායක එක්සත් ජාතික පක්ෂයේ (එජාප) රනිල් වික්‍රමසිංහ -- "සාමයට" කැමති බවක් කියා පාති. කෙසේ වෙතත් ඔවුන්ගෙන් එක් අයෙකු හෝ සට්ටනයට ප්‍රගතිශීලී විසඳුමක් ඉදිරිපත් කරන්නේ නැත. මේ දෙදෙනා අතර මතභේද හුදු උපාය පිලිබඳව වුවත් එය කටුක බවින් නොඅඩු ය.

රාජපක්ෂට පිටුබලය සපයන්නේ රාජ්‍ය නිලධරයේ ස්තර, හමුදාව, බෞද්ධ ප්‍රභූ තන්ත්‍රය සහ සිංහල ආධිපත්‍යය පවත්වා ගෙන යාම සමග තම උවමනාකම් බැඳී පවත්නා හා එල්ටීටීඊයට හෝ රටේ දෙමල සුලුතරයට මොන ම සහනයක් වත් දීමට විරුද්ධ ව්‍යාපාරික කොටස් ය. ඔහු ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ සිංහල අන්තවාදීන් සමග සන්ධානගත වී සිටී. මොවුහු මිලිටරිය ශක්තිමත් කිරීමට ද වත්මන් සටන් විරාමය සංශෝධනය කිරීමට ද දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ඒකාබද්ධව සුනාමි ආධාර පරිපාලනය කිරීමට ඇති කර ගන්නා ලද පී-ටොම්ස් ගිවිසුම අත හැර දැමීමට ද බල කර සිටිති. මෙම පිලිවෙත්වල තර්කනය වන්නේ යුද්ධයට පාර කැපීම ය.

අනෙක් අතට, වික්‍රමසිංහ ප්‍රකාශ කරන්නේ තමාට" සාම ක්‍රියාවලිය" අලුත් කිරීමට අවශ්‍ය බව ය. එහෙත් 1983 දී යුද්ධය ආරම්භ කිරීමට ද ඉක්බිති දශකයකට වැඩි කාලයක් නිර්දය ලෙස එය උග්‍ර කර පවත්වා ගෙන යාමට ද ඔහුගේ එජාපය වගකිව යුතු ය. ඔහු පැහැදිලිව ම නියෝජනය කරන්නේ ලෝකයේ ප්‍රධාන බලවත් රාජ්‍යයන්ගේ සහාය ලබා සිටින සංගත ප්‍රභූ ස්තරයන් ය. මොවුහු දන් යුද්ධය නිෂ්පාදනයේ ගෝලීය සන්තතියට දිවයින ඒකාග්‍ර කිරීමට බාධාවක් ලෙස සලකති. එල්ටීටීඊය සමග ඇති කර ගනු ලබන සම්මුතියක් වනාහි කම්කරු පන්තියේ සමාජමය තත්වයට එරෙහි දවැන්ත ප්‍රහාරයක් දියත් කිරීම සඳහා එල්ල කර ගත් සිංහල, දෙමල සහ මුස්ලිම් ප්‍රභූන් අතර බලය බෙදා ගැනීමේ සැලැස්මක් වනු ඇත. එපමනක් නො ව එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ ප්‍රජාගනවාදී ස්වභාවය නිසා ම එය යටින් පවත්නා ප්‍රශ්න එකක් වත් විසඳා ලනු නැත, ඉන් සිදු වනු ඇත්තේ අනිවාර්යයෙන් ම අනාගත ගැටුම සඳහා පදනම දැමීම ය.

සිය ගැටුම් විසඳා ගැනීමට හෝ සිය න්‍යාය පත්‍රයට ජන සහයෝගය දිනා ගැනීමට හෝ පාලක පන්තියට ඇති නොහැකියාව එක් දේශපාලන අර්බුදයකින් තවත් දේශපාලන අර්බුදයකට මග පාදා තිබේ. ගත වූ පස් වසර තුල මහ මැතිවරන හතරක් පවත්වා ඇත. එහෙත් ඒවා විසින් කිසිවක් විසඳනු ලැබුවේ නැත. ඒ වෙනුවට සිදු කරන ලද්දේ එන්න එන්න ම ගැඹුරු වූ දේශපාලන පක්ෂඝාතයක් නිර්මානය කිරීම යි. පාලක ප්‍රභූන් එන්න එන් නම වැඩි වැඩියෙන් එලඹෙන්නේ ඒකාධිපති පාලක රූපාකාරයන් දෙසට හැරී ගත යුතු ය යන නිගමනය කරා ය.

මෙම ජනපතිවරනය ම පවත්වනු ලබන්නේ පසු ගිය අගෝස්තුවේ දී විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් ඉක්බිති ආන්ඩුව විසින් පනවන ලද හදිසි නීති තත්වයක් යටතේ ය. කොලඹ සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය ම ඒ පිලිබඳව එල්ටීටීඊයට දොස් පැවරීමට වහා ම ඒකාබද්ධ වූ නමුත් ඝාතනයෙන් මාස දෙකකට පසුව ද ඒ පිලිබඳව කිසිදු තීරනාත්මක සාක්ෂියක් ප්‍රසිද්ධියේ එලිදරව් කර නැත. මෙම අපරාධය කවුරුන් විසින් කරනු ලැබුව ද එහි ප්‍රධාන දේශපාලන වාසිය ලැබුවෝ යුද්ධය ඉල්ලා හඬ තැලීම උග්‍ර කර ඇති ජවිපෙ හා ජාතික හෙල උරුමය සහ වත්මන් සටන් විරාමයට දැඩිව විරුද්ධව සිටින්නා වූ හමුදා නිලධරය ද වෙති. හමුදාව දෙමල ජනයාට එරෙහිව ප්‍රකෝපකාරී වට ලෑම් හා ආරක්ෂක මෙහෙයුම් දියත් කිරීම පිනිස හදිසි නීති බලතල ගසා කමින් ආතතියේ ද භීතියේ ද වාතාවරනය තව තවත් උග්‍ර කර ඇත.

ජනාධිපතිවරනයට අපේක්ෂකයන් 13 දෙනෙක් ඉදිරිපත්ව සිටිති. එහෙත් ඇත්ත වසයෙන් පවතින්නේ සැබෑ අභිමතයන් දෙකක් පමනි. එක් පසෙක පාලක පන්තියේ සහ රාජපක්ෂ හා වික්‍රමසිංහ විසින් නායකත්වය දෙනු ලබන එය තුල කුලල් කා ගන්නා කල්ලිවලින් සමන්විත කඳවුර ය. මොවුන් මලු පිටින් පොරොන්දු දී ඇති නමුත් වැඩ කරන ජනතාවගේ ගැටලු එකකට හෝ මොන ම විසඳුමක් වත් ඔවුන්ට නැත. අනෙක් අතට, සසප සටන් වැද සිටින්නේ, යුද්ධය අවසන් කොට සැබෑ සමාජ සමානතාව පිහිටුවා ලීම සඳහා සමාජවාදී අනාගතයක් උදෙසා සටන් කිරීමට කම්කරු පන්තිය සියලු පාලක ප්‍රභූන්ගෙන් ස්වාධීන වූ නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නගා ගත යුතු ය යන්න පැහැදිලි කිරීම සඳහා ය. අන් සියලු අපේක්ෂකයෝ ඍජුව හා වක්‍රව රාජපක්ෂ හෝ වික්‍රමසිංහ පිටුපස පෙල ගැසී සිටිති.

## එක්සත් ජනපද යුදවාදයේ පුපුරා යාම

ශ්‍රී ලංකාවේ එන්න එන්න ම ගැඹුරු වන්නා වූ ආර්ථික, සමාජ සහ දේශපාලන අර්බුදය වනාහි තාවකාලික හෝ දේශීය ප්‍රපංචයක් නො වේ. නැත. එය වනාහි ලාභ ගරන පද්ධතිය ම දෙදරවා යවමින් පවත්නා අවිසර්ජනීය ප්‍රතිසතිතතාවන්ගේ ම, ඒ අතරිනුත් නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ වඩ වඩාත් ගෝලීයකෘත ස්වභාවය සහ ධනවාදය තව මත් මුල් බැස පවතින්නා වූ බංකොලොත් ජාතික රාජ්‍ය පද්ධතිය අතර ප්‍රතිසතිතතාවෙහි නිෂ්පාදිතයකි. අද ලෝක දේශපාලනයේ සාතිශය අස්ථායිකාරී සාධකය බවට පත්ව තිබෙන්නේ ඉහත සඳහන් අතිමූලික ප්‍රතිසතිතතාව විසඳා ගැනීම සඳහා භූගෝලයේ අස්සක් මුල්ලක් නැර තම පිලිමලුන් මත ආධිපත්‍යය පිහිටුවා ගැනීම සඳහා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය යෙදී ගෙන සිටින්නා වූ ඉවබව නැති දුෂ්යත්නය යි.

“ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය” යන ව්‍යාජ ධජය යටතේ බුෂ් පාලනාධිකාරය ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය නව-විජිතවාදී පාලන රූපයන්ට යටත් කොට ගෙන සිටී. මෙම රටවලට සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒම කවර කලෙක වත් වොෂිංටනයේ අරමුන වූයේ නැත. ඒ වෙනුවට වොෂිංටනයේ ඉලක්කය වූයේ මැද පෙරදිග ද මධ්‍යම ආසියාවේ ද තෙල් සහ ගෑස් නිධි සහිත ප්‍රදේශ නතු කර ගැනීමේ තම අභිලාෂය ඉෂ්ට කර ගැනීම සඳහා මෙම රටවල් යොදා ගැනීම ය. ඉන්දියානු උප-මහාද්වීපය මත සිය ආධිපත්‍යය ස්ථාපනය කර ගැනීමට ද එක්සත් ජනපදය මීට නොඅඩුව උත්සුක වී සිටී. 2001 පටන් ම බුෂ් පාලනාධිකාරය ශ්‍රී ලංකාවේ “සාම ක්‍රියාවලිය” යලි අලුත් කිරීමට බල කර තිබේ. ඒ සමග ම ඉන්දියාව හා පකිස්ථානය අතර සාම සාකච්ඡාවලට පෝර දමා නේපාලයේ මාඕවාදී සන්නද්ධ අරගලයට සාකච්ඡා මගින් “විසඳුමක්” ලබා දීමට ද බුෂ් පාලනාධිකාරය යත්න දරා තිබේ.

දකුනු ආසියාව තුල “සාමය” සඳහා වොෂිංටනය දක්වන සහයෝගය ලෝකයේ වෙනත් ප්‍රදේශ තුල එය පවත්වා ගෙන යන්නා වූ ආක්‍රමනික යුදවාදයට ප්‍රතිවිරුද්ධ නැත. මෙම උපායන් දෙක වනාහි එක ම කාසියේ දෙපැත්ත ය. ශ්‍රී ලංකාවේ සට්ටනය ද ඉන්දියාව සහ පකිස්ථානය අතර ප්‍රතිමල්ලතාව ද මෙම කලාපයේ වැඩී නැග එන එක්සත් ජනපද ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනය කර සිටී. චීනය මෙන් ඉන්දියාව ද ගෝලීය පරිමාන ආයෝජනයන් සඳහා ප්‍රමුඛ ඉලක්කයක් බවට පත්ව ඇත. පහල යන ලාභානුපාතිකවලට මුහුන දී එකිනෙකා සමග දරුනු තරගයකට ඇද වැටී පවත්නා ජාත්‍යන්තර මහා සංගතයෝ, බැලූ බැල්මට ඉමක්-කොනක් නැතැයි පෙනී යන ඉන්දියාවේ ලාභ, උගත් ශ්‍රම සංචිතයට අත පොවා ගැනීම, සිය පන රැක ගන්නා රැහැන් පටක් සේ දකිති. 1991-92 වර්ෂයේ දී යන්තම් ඩොලර් මිලියන 129ක් වූ ඉන්දියාවේ වාර්ෂික ඍජු විදේශ ආයෝජන මේ වර්ෂයේ ඩොලර් බිලියන 5ක මට්ටමට ඉහලට පනිනු ඇතැයි ගනන් බැලෙයි.

ඉන්දියාව එක්සත් ජනපද මූලෝපායික සැලසුම්වල අත්‍යවශ්‍ය අංගයකි. එය චීනයට එරෙහිව ඇමරිකාවට ඇති කර ගත හැකි මිත්‍රයෙක් ද මැද පෙරදිගට සහ මධ්‍යම ආසියාවට ඇතුලු වීම සඳහා ප්‍රයෝජනවත් එලිපත්තක් ද වේ. සාමය ගෙන එනවා වෙනුවට වොෂිංටනය දකුනු ආසියාවේ කර ගෙන යන යටිකුට්ටු කුමන්ත්‍රන විසින් ඉටු කරනු ලබන්නේ අනාගතයේ දී අලුත් සහ වඩාත් විනාශකාරී සට්ටනයන්ට වේදිකාව සම්පාදනය කිරීම ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත හොත්, ඇෆ්ඝනිස්ථානයේ සහ ඉරාකයේ ආක්‍රමනයන් මගින් පැහැදිලිව අනතුරු අඟවනු ලබන්නේ, යම්

හෙයකින් "සාම ක්‍රියාවලිය" තුලින් එක්සත් ජනපදයේ අරමුනු ඉෂ්ට කර ගත නොහැකි වුව හොත් මේ කුඩා දිවයින යලිත් වරක් යුද්ධයේ වේරම්බය තුලට ඇද දැමීමට ධවල මන්දිරය කිසි සේත් ම පසුබට නොවනු ඇති බවට ය.

බුෂ් පාලනාධිකාරයේ යටිකුට්ටු හා කුමන්ත්‍රන ඉදිරියට ගොස් තිබෙන්නේ උප-මහාද්වීපයේ පාලක ප්‍රභූන්ගේ කිසිදු විරුද්ධත්වයකින් තොරව ය. මොවුහු පෙර කල යොදා ගත් අධිරාජ්‍ය විරෝධී වාග් හරඹ මුලුමනින් ම එකා වන්ව අත හැර දමා ඇත්තාහ. සීතල යුද්ධයේ අවසානය වොෂිංටනය සහ මොස්කව් අතර උපාමාරු දැමීමට ද "නොබැඳි", "ස්වාධීන" එසේත් නැත හොත් එපමනක් නො ව "සමාජවාදී" පවා යනාදි වසයෙන් වෙස් දැක්වීමට ද මොවුන්ට තිබුනු ඉඩකඩ අහෝසි කර දමා තිබේ. "එක්කො ඔබ අප සමග ය, එසේ නැති නම් අපට විරුද්ධ ය" යැයි බුෂ් විසින් පනවන ලද ආඥාවට මෙම කලාපයේ නායකයන් හෝ පක්ෂ සියල්ල ම ප්‍රතිචාර දක්වා තිබෙන්නේ, ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය ආක්‍රමනය කිරීම යටහත් පහත් ලෙස පිලිගනිමින් සහ "ත්‍රස්ත-විරෝධී යුද්ධය" තමන්ගේ ම අරමුනු සඳහා යොදා ගැනීමට උත්සාහ කරමිනි.

එක පැත්තකින්, ශ්‍රී ලංකාවේ "සාම ක්‍රියාවලියේ" පක්ෂවාදීහු එල්ටීටීඊය තමන්ගේ කොන්දේසි මත සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීමට අවස්ථාවක් ලෙස එය දුටුවහ. ශ්‍රීලනිප සාමාජිකයන් එජාපයට මාරු වීම 2001 දී මැතිවරනයකට පාර කැපූ අතර වික්‍රමසිංහගේ නව ආන්ඩුව 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට සාම සාකච්ඡා ආරම්භ කලේ ය. අනෙක් අතට, එල්ටීටීඊය යුද්ධමය වසයෙන් තලා දැමීම අරමුනු කර ගත් අය ද තමන්ගේ ම "ත්‍රස්ත විරෝධී යුද්ධය" සඳහා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය හවුල් කර ගැනීමට මාන බලා ඇත. අතීතයේ දී ගිනියම් එහෙත් පුස් අධිරාජ්‍ය-විරෝධී වාග් පාඨ හඬ තැලූ ජවිපෙ නායකයෝ දැන් ලංකාවට එන ඇමරිකානු ඉහල නිලධාරීන් සමග කතිකා සඳහා නිරතුරුව ම කොලඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආගන්තුක සත්කාර භුක්ති විඳිති.

ඉන්දියානු උප-මහාද්වීපය පුරා සමාජවාදය සඳහා කෙරෙන අරගලය සකල ආකාර අධිරාජ්‍ය ආක්‍රමනයට ද නව-විජිතවාදී පීඩනයට ද එරෙහිව ම පිහිටා ඇත. ධනේශ්වරයේ බියගුලු දේශපාලන නියෝජිතයන් මෙන් නො ව, සසප ඉරාකයෙන් හා ඇෆ්ඝනිස්ථානයෙන් විදේශීය හමුදාවන් වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ද ගුවන්තනාමෝ වරායේ, දියාගෝ ගාර්ෂියාවේ හා ලෝකය පුරා පිහිටි අනෙකුත් එක්සත් ජනපද සිර කඳවුරුවල රඳවා ගෙන සිටින සියලු යුද සිරකරුවන් නිදහස් කරන ලෙස ද ස්ථිරසාරව ම ඉල්ලා සිටී. මෙම යුද්ධය සැලසුම් කිරීමට ද සංවිධානය කිරීමට ද වගකිව යුත්තන් සියලු දෙනා මුලුමනින් ම එලිදරව් කල යුතු ය. ඔවුන්ට එරෙහි නඩු විභාග කොට යුද්ධාපරාධකාරයන් ලෙස දඬුවම් දිය යුතු ය. දකුනු ආසියාවේ කම්කරුවන් ඇමරිකාවේ ද යුරෝපයේ ද ලෝකයේ සෙසු ප්‍රදේශවල ද ඔවුන්ගේ පන්ති සහෝදරසහෝදරියන් සමග එක්ව පෙල ගස්වා ගෙන අධිරාජ්‍යවාදයට එරෙහි ජගත් ප්‍රතිප්‍රහාරයක් වර්ධනය කිරීමේ අපි යෙදී සිටිමු.

## පශ්චාත් යුද කාලීන "ස්වාධීනතාව" පිලිබඳ ශේෂ පත්‍රයක්

දකුනු ආසියාවේ කම්කරු පන්තියට පසු ගිය අර්ධ ශතවර්ෂයේ අත්දැකීම් පිලිබඳ ශේෂ පත්‍රයක් සකස් කර ගැනීමට දැන් කාලය එලඹ තිබේ. පශ්චාත් යුද "ස්වාධීනතා" සමථයන්ගේ සමස්ත දිග් ගැසුනු අත්හදා බැලීම ම වනාහි මුලුමනින් ම විනාශකාරී එකක් බවට දැන් ඔප්පු වී හමාර ය. ධනේශ්වර පන්තිය ඉන්දු උප-මහාද්වීපයේ කුමන තැනක හෝ වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අපේක්ෂාවන් හා සමාජ අවශ්‍යතා සපුරාලීමට සමත් වී නැත. කෝටි සංඛ්‍යාත ජනයාට අගහිඟ බවේ ගිලී මනා සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය සහ අනෙකුත් සමාජ සේවා තිබියේ වා අඩු වසයෙන් පිරිසිදු වතුර හෝ විදුලි බලයෙන් තොරව, තම ජීවිත ගෙවා දැමීමට සිදුව ඇත. මෙම ඉතා හදිසි අවශ්‍යතාවලට පිලිතුරු වසයෙන් විවිධ ආන්ඩු විසින් කර ඇත්තේ, එක ම දෙයක් තව තවත් පැටවීම යි -- එය වනාහි පොහොසතුන් සහ දුප්පතුන් අතර සමාජ පරතරය තව තවත් උග්‍ර කරන, නිදහස් වෙලඳ පොලේ නිර්බාධිත ක්‍රියාකාරිත්වය යි.

පාලක පන්තීහු, දුවැන්ත වූ සමාජ අර්බුදය විසඳා ලීමට අසමත්ව, වැඩ කරන ජනතාව එකිනෙකාට එරෙහිව කෙටවීම පිනිස ප්‍රජාගනවාදී, කුලවාදී සහ ජනවාර්ගික භේදයන් යලි යලිත් අවුලුවා ලමින් බ්‍රිතාන්‍ය විජිතවාදීන්ගේ "බෙදා පාලනය කිරීමේ" පිලිවෙත තව දුරටත් ඉදිරියට ගෙන ගොස් ඇත්තේ, ව්‍යසනකාරී ප්‍රතිවිපාක ජනිත කරමිනි. මෙම කලාපයේ කෘත්‍රිම ජාතික දේශ සීමා වනාහි, විජිත විරෝධී මහා ජනතා ව්‍යාපාරය ගබ්සා කර දැමීමට ඉන්දියානු ජාතික කොංග්‍රසයේ ධනේශ්වර නායකයන් බ්‍රිතාන්‍ය විජිත පාලකයන් සමග ඇති කර ගැනුනු කුමන්ත්‍රනකාරී හවුලේ ඍජු ප්‍රතිවිපාකය යි. මුස්ලිම් පකිස්ථානයක් ද විශාල වසයෙන් හින්දු වූ ඉන්දියාවක් ද ලෙස උප-මහාද්වීපය හිතුවක්කාර ලෙස බෙදා වෙන් කිරීම කාශ්මීරය අල්ලා ගැනීම සඳහා යුද්ධයකට සහ ලක්ෂ ගනනාවකගේ ජීවිත විනාශයට මග පෑදූ ප්‍රජාගනවාදී ප්‍රචන්ඩත්වයකට ක්ෂනිකව ම දොර හැර ලූ අතර ම අනාගත ජන සංහාරයන්ට හා යුද්ධවලට ද කරලිය සැකසී ය.

බ්‍රිතාන්‍ය විජිතයක්ව පැවති ලංකාව, ශ්‍රී ලංකාව නමැති ජාතික රාජ්‍යය බවට ප්‍රතිවර්තනය කිරීමේ ප්‍රතිසන්ධිය සිදු වූයේ කොලඹ දී නො වේ, ලන්ඩනයේ විජිත කාර්යාලයේ දී ය. මෙම කලාපය අලලා ගත් විප්ලවවාදී ප්‍රකම්පනයන්ට මුහුන දී සිටි විජිත පාලකයෝ මූලෝපායික වැදගත්කමක් සහිත භූගෝලීය පිහිටීමකින් යුක්ත වූ මෙම දිවයින දකුනු ආසියාවේ බ්‍රිතාන්‍ය අවශ්‍යතාවලට සුරක්ෂිත පදනමක් සපයනු ඇතැයි ගනන් බැලූහ. ඉන්දියානු බොල්ෂේවික් ලෙනින්වාදී පක්ෂයේ (බීඑල්පීඅයි) ට්‍රොට්ස්කිවාදීන් විසින් නායකත්වය සැපැයුනු විජිත විරෝධී ව්‍යාපාරයට සතුරු වූ ඩී.එස්. සේනානායක ඇතුලු ශ්‍රී ලංකාවේ “ආදි පියවරුන්” මත “ස්වාධීනතාව” පටවන ලද්දේ බලයෙනි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් හා ලංකාවේ ධනපතියන් අතර මෙම ජාවාරමේ කොන්දේසිවලට දිවයිනේ භූමිය තුල බ්‍රිතාන්‍ය යුද කඳවුරු පවත්වා ගෙන යාම ද ඇතුලත් විය.

දූරදක්නා විශ්ලේෂනයක් කල බීඑල්පීඅයි නායකයෝ, දකුනු ආසියාවේ අලුතෙන් නිර්මානය කරන ලද රාජ්‍යයන් සමන්විත වූයේ සැබෑ ස්වාධීනතාවකින් නොවන බවත් එය සරලව ම අධිරාජ්‍යවාදී පර්යාය “යලි හැඩ ගැන්වීමක්” පමනක් බවත් පැහැදිලි කලහ. 1948 දී ම ප්‍රජාගන යුද්ධය පිලිබඳ පෙරදක්නා අනතුරු ඇඟවීමක් කල ඔවුහු, “දේශ සීමාවේ දෙපැත්තේ ම සිටින්නා වූ ප්‍රතිගාමී රාජ්‍ය ප්‍රසාරකයන්” ප්‍රතික්ෂේප කොට “උප-මහාද්වීපය ස්වේච්ඡාවෙන් යලි එක්සත් කිරීමට” සටන් කරන ලෙස ඉන්දියානු හා පකිස්ථාන කම්කරුවන්ට කැඳවුම් කලහ. එවන් ස්වේච්ඡා ඒකාබද්ධ කිරීමක්” ඉන්දියානු සංගමය හා පකිස්ථානය යන දෙරට ම තුල සමාජ විප්ලවය මගින් හැර වෙන කිසි ම අයුරකින් ඉටු කල නොහැකි” ය යි ද ඔවුහු අවධාරනය කලහ.

“ආදි පියවරුන්” බ්‍රිතාන්‍යය විසින් අටවන ලද 1948 බලය පවරා දීමේ සැනකෙලිවලට කීකරුව සම්බන්ධ වූ ලංකාව තුල දී, බීඑල්පීඅයි සංවිධානය, මෙම ව්‍යාජ ස්වාධීනතාවට සිය විරුද්ධත්වය දක්වීම සඳහා ගාලු මුවදොර පිටියේ කම්කරුවන් 50,000ක සහභාගිත්වයෙන් රැලියක් පැවැත්වී ය. ශ්‍රී ලංකාවේ ධනේශ්වර පන්තිය මුල පිරූ තැන් පටන් ම තම අඩමාන පාලනයට මතවාදී පදනමක් නිර්මානය කර ගැනීම සඳහා සිංහල බෞද්ධ අධිපතිවාදයේ පිහිට සෙවූහ. ප්‍රථම එජාප ආන්ඩුව ගත් මුල් ම පියවරක් වූයේ දෙමල කතා කරන වතු කම්කරුවන් දශලක්ෂයක පුරවැසි අයිතීන් අහෝසි කිරීම ය. ඒ වනාහි දිවයිනේ මුලු ජනගහනයෙන් දහයෙන් පංගුවකට වැඩි සංඛ්‍යාවකි.

බීඑල්පීඅයි නායකයන් ඉක්බිති සමයේ පශ්චාත් යුද කාලීන රාමුවට අනුගත වීම දකුනු ආසියාවේ කම්කරු පන්තියට ඛේදජනක ප්‍රතිවිපාක අත් කර දුනි. උප-මහාද්වීපය පුරා කම්කරුවන් එක්සත් කිරීමේ සමස්ත ඉන්දියානු ඉදිරි දර්ශනයක් මත පදනම් කොට පිහිටැවුනු බීඑල්පීඅයි සංවිධානය ඉන්දියාවේ දී කොංග්‍රස් සෝශලිස්ට් පක්ෂය තුලට දිය කර හරින ලද අතර ලංකවේ දී යලිත් පිහිටුවනු ලැබූ ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) අවස්ථාවාදීන් සමග ප්‍රතිපත්ති විරහිත යලි-එක්සත් වීමකට එලඹුනි. මහජනතාවට වඩාත් ලං වීමේ නාමයෙන් ලසසප සිංහල ජාත්‍යෝත්තමවාදයට විරුද්ධව සටන් කරනවා වෙනුවට එයට අනුගත වී අවසානයේ සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම මුලුමනින් ම හැර පියා 1964 දී සිරිමා බන්ඩාරනායක මහත්මියගේ ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් ආන්ඩුවට ඇතුලු විය. ධනේශ්වර ආන්ඩුවක ඇමතිවරුන් හැටියට ලසසප නායකයෝ, බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස ද සිංහල රාජ්‍ය භාෂාව ලෙස ද ස්ථාපනය කල 1972 ව්‍යවස්ථාව සකස් කිරීමට වගකිව යුත්තෝ වූහ.

ලසසප පාවා දීම සිවිල් යුද්ධයේ බීජ වපුලේ ය. ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ සිංහල, දෙමල හා මුස්ලිම් යන සියලු කොටස්වල අවශ්‍යතා සඳහා ඒකාබද්ධ පදනමක සටන් කිරීම අත හැර දැමීම මගින් ලසසප, ප්‍රතිගාමී ප්‍රජාගනවාදී දේශපාලනයට ශ්‍රාවක සමූහයක් දිනා ගැනීම සඳහා සුලු ධනේශ්වර රැඩිකල් සංවිධානවලට දොර හැර දුන්නේ ය. දකුනේ දී, ජවිපෙ, මාඕවාදය හා ගුවේරාවාදය කලතා ගත් සිංහල ජාත්‍යෝත්තමවාදයේ පදනම මත ගම්බද සිංහල තරුනයන්ට ආයාචන කලේ ය. උතුරේ දී, එල්ටීටීඊය, රාජ්‍ය අනුග්‍රහයෙන් කෙරෙන වෙනස්කම් අවසන් කිරීමේ විධික්‍රමයක් ලෙස, ඊලම් නමින් වෙන ම රාජ්‍ය කැබැලිත්තක රූපාකාරයෙන්, දෙමල බෙදුම්වාදය වෙනුවෙන් සටන් කරන ලෙස අසහනයට පත් දෙමල තරුනයන්ට කැඳවුම් කලේ ය.

කොලඹ ආන්ඩු එක පිට එක තමන් අත බලය පවත්වා ගැනීම සඳහා සිංහල ජාත්‍යෝත්තමවාදය අවුලුවා ඇත. 1983 සිවිල් යුද්ධයට පෙරාතුව, එජාපය තම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරන පිලිවෙත් විසින් ඇති කරන ලද සමාජ ව්‍යසනයෙන් මහජන අවධානය ඉවතට යොමු කිරීම සඳහා දුෂ්ට දීප ව්‍යාප්ත දෙමල විරෝධී සංහාරයක් දියත් කලේ ය. මීට සමාන්තර සන්තතීන් උප-මහාද්වීපය පුරා ම සිද්ධ වී තිබේ. කම්කරු පන්තිය බෙදා ලා තමන්ගේ ම වරප්‍රසාදිත තත්වය රැක ගැනීම සඳහා පකිස්ථානයේ සහ ඉන්දියාවේ පාලක ප්‍රභූන් විසින් ඉස්ලාමීය මූලධර්මවාදය සහ හින්දු ආධිපත්‍යවාදය ද සමග කුල භේදවාදී හා වාර්ගික දේශපාලනය සිතාමතා ම පෝෂනය කරනු ලැබ ඇත.

කම්කරු පන්තිය සිය ස්වාධීන පන්ති අවශ්‍යතා සුරැකීම උදෙසා, බීඑල්පීඅයි සංවිධානය විසින් තහවුරු කරනු ලැබූ ජාත්‍යන්තරවාදී සම්ප්‍රදායන් යලි පන

ගැන්විය යුතු ය. සසපය දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා සහ ඊලම් සමාජවාදී එක්සත් සමූහාන්ඩුවක් පිහිටුවීම සඳහා සටන් වදී. මෙය වනාහි ධනවාදය අහෝසි කිරීමේ ගෝලීය අරගලයේ කොටසක් ලෙස මුලු මහත් කලාපයේ ම කම්කරුවන් හා පීඩිත ජනතාව ඒකාබද්ධ කොට බලමුලු ගන්වා ගැනීමේ විධික්‍රමය යි.

## සිවිල් යුද්ධයට සමාජවාදී විසඳුමක්

සිවිල් යුද්ධයට ස්ථිරසාර ලෙස විරුද්ධ වූ එක ම දේශපාලන පක්ෂය වනාහි සමාජවාදී සමානතා පක්ෂයත් එහි පූර්ව-ප්‍රාප්තික විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයත් ය. සැබෑ හා කල් පවත්නා සාමයක් ඇති කර ගැනීම සඳහා පදනම දැමීමට එක ම මාවත වසයෙන්, ශ්‍රී ලංකාවේ සියලු මිලිටරි හමුදා කොන්දේසි විරහිතව හා වහා ම උතුරෙන් හා නැගෙනහිරෙන් ඉවත් කර ගත යුතු යැයි අපි ඉල්ලා සිටිමු. යුද්ධය අවසන් කිරීමට තම ක්‍රියා මාර්ගය ඉදිරිපත් කිරීමේ දී සසප මෙහෙයවී ඇත්තේ තනි ප්‍රමුඛ මූලධර්මයකිනි, එය නම්, කම්කරු පන්තිය ධනේශ්වර පක්ෂවලින් හා ධනේශ්වර රාජ්‍යයෙන් වෙන්ව තම දේශපාලන ස්වාධීනත්වය තහවුරු කර ගැනීමේ අවශ්‍යතාව යි.

වික්‍රමසිංහගේ හෝ රාජපක්ෂගේ අනුග්‍රහය යටතේ සාමය අත්පත් කර ගත හැකි යැයි විශ්වාස කිරීම වනාහි මිථ්‍යාවකි. මෙයට ප්‍රතිකූලව, සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්, ඔවුන් එජාපයට හා ශ්‍රීලනිපයට බැඳී ඉන්නා තාක්, යුද්ධයේ නිරන්තර තර්ජනයට මුහුන දෙනු ඇත. යුද්ධයට දිගු කල් පවත්නා විසඳුමක් ඉදිරිපත් කිරීමට සමත් වන්නේ කම්කරු පන්තිය පමනකි. ඒ පීඩිත ගම්බද ජනතාවට ආමන්ත්‍රනය කිරීමෙනි, සකල වර්ගයේ ප්‍රජාගනවාදයන්, ස්වෝත්තමවාදයන් හා බෙදුම්වාදයන් පොදුවේ ප්‍රතික්ෂේප කරමින් දෙමල, සිංහල, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ජනයා එක්සත් කිරීමෙනි, මෙම පදනම මත කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා මහජන විප්ලවවාදී ව්‍යාපාරයක් වර්ධනය කිරීමෙනි.

ඒකීය රාජ්‍යය සන්නද්ධ බලය මගින් පවත්වා ගෙන යාමට සසපය විරුද්ධ ය. එවන් පිලිවෙතක් දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහරක් වනවා පමනක් නො ව, රට පුරා යුදවාදයේ ආධිපත්‍යයට ද ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට වල කැපීමට ද අනිවාර්යයෙන් ම මග පාදයි.

ඒ සමග ම, සසපය, වෙන ම ධනේශ්වර දෙමල ඊලම් රාජ්‍ය කැබැලිත්තක් සඳහා වන එල්ටීටීඊයේ ඉල්ලීමට ද විරුද්ධ වේ. මෙම ඉල්ලීම ප්‍රකාශනයක් අත් කර දෙන්නේ, දෙමල ජනතාවගේ අවශ්‍යතාවන්ට නො ව, පලස්තීන විමුක්ති සංවිධානය, අප්‍රිකානු ජාතික සංගමය සහ අයර්ලන්ත සමූහාන්ඩු හමුදාව වැනි වෙනත් ජාතික ව්‍යාපාරයන් තුල සිටින තම සම-තත්වධාරීන් මෙන් ම කම්කරු පන්තිය සූරා කෑම සඳහා ගෝලීය ප්‍රාග්ධනය සමග තමන්ගේ ම සබඳතා තහවුරු කර ගැනීමට උනන්දුව සිටින, දෙමල ධනේශ්වරයේ අවශ්‍යතාවන්ට ය. උතුරේ හා නැගෙනහිර පාලනය එල්ටීටීඊය අතට පත් වී නම් එය ක්ෂනිකව කරනු ඇත්තේ කෙලින් ම දෙමල කම්කරුවන්ගේ වියදමින් තමන්ට හා භූගෝලීය ආයෝජකයන්ට අන්‍යෝන්‍යව වාසි සහගත වූ සැලැස්මක් අටවා ගැනීමට එම ආයෝජකයන්ට ආයාචන කිරීම ය.

එසේ ම, සසප, "සාම" ජාවාරමක කොටසක් ලෙස යෝජිතව පවත්නා විවිධ බලය බෙදා හැරීමේ සැලසුම්වලට ද විරුද්ධ වේ. මෙම සැලසුම්වලට පොදු වූ ලක්ෂන දෙකක් පවතී. එනම් ප්‍රජාගනවාදය සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් කෙරෙහි ඇති පිලිකුල ය. මේ සෑම වැඩ සටහනක් ම අන්තර්ගත කර ගන්නේ ඡන්දයෙන් තෝරා පත් කර නොගත්, ජාති-ආගම් භේද මත පදනම් වූ, ගෝලීය ප්‍රාග්ධනයේ ආඥාවන් ක්‍රියාත්මක කිරීමේ දී කොලඹ සමග සහයෝගයෙන් ක්‍රියා කිරීමට සූදානම් අන්තර්-කාල පාලනාධිකාරයක් උතුරේ සහ නැගෙනහිර ඇටවීම ය. ඒ සමග ම, මුස්ලිම්, දෙමල සහ සිංහල ප්‍රජාවන් අතර භේදයන් සංස්ථාගත කිරීම අනිවාර්යයෙන් ම අනාගත ආතතීන්ට හා ගැටුම්වලට පදනම දමනු ඇත.

සසපය, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී සමථයක් සඳහා අත්තිවාරම් දැමීමට, ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් කැඳවීමට යෝජනා කරයි. නව ව්‍යවස්ථාවක් සම්පාදනය කොට සියලු නොවිසඳුනු ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ ප්‍රශ්න විසඳා ලීම එයට භාර වනු ඇත. සසපයේ යෝජනාවට 1972 සහ 1978 ව්‍යවස්ථාවන් සකස් කිරීම සඳහා කරන ලද නරුම හරඹයන් සමග කිසිදු පොදු බවක් ඇත්තේ නැත. මෙම ජනපතිවරනයෙන් පසු රාජපක්ෂ යලිත් කරන්ට යන්නේ මේ ජාතියේ ම වැඩකි. බහුතරයේ අවශ්‍යතා සැබවින් ම ප්‍රකාශිත කරන්නා වූ නව ව්‍යවස්ථාවක් සකසා ගත යුත්තේ, වැඩ කරන ජනයා විසින් තමන් සඳහා විවෘතව හා ප්‍රජාතාන්ත්‍රිකව තෝරා පත් කර ගැනෙන, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ නියෝජිත සභාවක් මගින් මිස, මහජනතාවට පිටුපසින් ක්‍රියාත්මක වන විවිධ ධනේශ්වර දේශපාලනඥ කල්ලි විසින් නො වේ.

ආගම සහ රාජ්‍යය වෙන් කිරීමකින් තොරව, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් පිහිටුවා ලීම කල හැක්කක් නො වේ. මෙහි අර්ථය වන්නේ රාජ්‍ය ආගමක් ලෙස බුද්ධාගමට ඇති තත්වය අවසන් කිරීම සහ ආගමික සංස්ථාවන්ට රජයෙන් දෙන සියලු සහනාධාර අහෝසි කිරීම ය. වතුකරයේ දෙමල ජනයාට ඔවුන්ගේ සම්පූර්න අයිතිවාසිකම් නැති කර දමන සියලු නීතිමය බාධා සමග ම මහජන ආරක්ෂක පනත, හදිසි නීති රෙගුලාසි සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යන මේ සියල්ල

ඇතුලත් සියලු මර්දනකාරී සහ අගති සහගත නීති අහෝසි කිරීම එවන් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා අවශ්‍ය වේ.

## ගැඹුරු වන්නා වූ සමාජ අසමානතාව

රාජපක්ෂ සහ වික්‍රමසිංහ ඡන්ද දායකයන් රැවටීම සඳහා හිස් මැතිවරන පොරොන්දු දීමේ තරුම වෙන්දේසි පොරයක යෙදී සිටිති. ආන්ඩුවේ ආර්ථික න්‍යාය පත්‍රය තීන්දු කරනු ලබන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් මිස තම මැතිවරන ප්‍රකාශන මගින් නොවන බව අපේක්ෂකයෝ දෙදෙනා ම හොඳින් දනිති. මැතිවරනය හමාර වූ වහා ම ගෝලීය ප්‍රාග්ධනය වියදම් කප්පාදුවල නව වටයක් ඉල්ලා සිටිනු ඇත, මෙයට ඉන්ධන සහනාධාර කැපීම ද අත්‍යවශ්‍ය සමාජ සේවාවන් තව දුරටත් කප්පාදු කිරීම ද ඇතුලත් වනු ඇත. වැඩි ම බර අනිවාර්යයෙන් ම පැටවෙනු ඇත්තේ එයට උර දීමේ හැකියාව අඩු ම ජන කොටස් මත ය.

පාලක පන්තියේ දේශපාලන බංකොලොත්කමේ පැහැදිලි ම ප්‍රකාශනය වන්නේ, දිවයිනේ වෙරලාසන්න ප්‍රදේශවල 40,000කට ආසන්න සංඛ්‍යාවක් මරුමුවට පත් කල සහ අඩු ගනනේ තවත් 800,000කට කෙලින් ම බලපෑ දෙසැම්බර් 26 සුනාමියේ භයංකර විනාශයට පිලියම් යෙදීමට ඔවුන් මුලුමනින් ම අසමත් වීම යි. මෙම මහ රල පහර නිසා නිවාස 80,000ක් ද පාසල්, රෝහල් හා වෙනත් අත්‍යවශ්‍ය සේවා ගොඩනැගිලි ද විනාශයට ලක් වූ නමුත් ඒවා යලි ගොඩ නැගීමේ වැඩ කටයුතු ඇරඹී ඇත්තේ යන්තමිනි. නිල සංඛ්‍යා ලේඛන අනුව ව්‍යසනයෙන් දස මසකට පසුව නිමවා ඇත්තේ නව නිවාස 1,126කි. තවත් 15,619ක් ඉදි කිරීමේ විවිධ මට්ටම්වල පවතී. ගොදුරු වූවන්ගෙන් බහුතරයක් වූ අතිබහුල වසයෙන් දුප්පත් ජනයාට තව මත් ජීවත් වීමට සිදුව ඇත්තේ අස්ථිර අනාථ කඳවුරුවල ය, නැත හොත් ඔවුන්ට තම මිත්‍රයන්ගේ හෝ ඥාතීන්ගේ හව්හරනය පැතීමට සිදුව ඇත.

පිට පිට ආ එජාප හා ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් ආන්ඩු යටතේ ක්‍රියාත්මක කෙරුනු දශක දෙකකට වැඩි නිදහස් වෙලඳ පොල පිලිවෙත් විසින් සිදු කරන ලද ආර්ථික සහ සමාජ ව්‍යසනයේ ඉතා මත් පැහැදිලිව පෙනෙන ප්‍රකාශනය වන්නේ සුනාමි ඛේදවාචකයට ගොදුරු වූවන් ඇද වැටී සිටින්නා වූ තත්වය යි. භ්‍රාත්‍යඝාතක යුද්ධයකට ඩොලර් බිලියන ගනන් වැය කොට ඇති නමුත් ස්වාභාවික විපත්වලට එරෙහිව සටන් වැදීම සඳහා අවශ්‍ය මූලික සැලසුම් ඇතුලු අත්‍යවශ්‍ය සමාජ හා භෞතික යටිතල පහසුකම් නො තකා හැර අබලන්ව පවතී. පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන පොහෙසතුන් හා දුප්පතුන් අතර පලල් වන අගාධය විදහා දක්වයි.

* මෑත ම වාර්තාවක් වන, මහ බැංකුවේ 2003/2004 වසර සඳහා වූ *පාරිභෝගික මූල්‍ය සමීක්ෂන වාර්තාවට* අනුව, ජනගහනයෙන් පොහොසත් ම සියයට 20 ජාතික ආදායමෙන් ලබන පංගුව 1996/1997 වර්ෂයේ සියයට 53 සිට 2003/2004 වර්ෂයේ සියයට 55.1 දක්වා ඉහල නැංගේ ය. දුප්පත් ම සියයට 20 ලද ප්‍රතිශතය මෙම කාල පරිච්ඡේදය තුල සියයට 4 සිට සියයට 3.6 දක්වා පහතට වැටුනි. මෙම වාර්තාවට අනුව, පොහොසත් ම සියයට 10 ජාතික ආදායමෙන් අත්පත් කර ගත් සියයට 39.7ට සන්සන්දනාත්මකව දුප්පත් ම සියයට 10 ජාතික ආදායමෙන් අත්පත් කර ගත් පංගුව යන්තම් සියයට 1.1කි.

මුලු ජනගහනයෙන් සියයට 26ක් ම දිනකට ඩොලර් එකක් (රුපියල් 100) වූ දරිද්‍රතා කඩඉමට පහලින් දිවි ගෙවති. ජනගහනයෙන් හරි අඩකට ආසන්න ප්‍රමානයක් -- සියයට 45ක් -- ජීවත් වන්නේ දවසකට ඩොලර් 2කට අඩු ආදායමකිනි. ඉතා ම මෑත ලෝක බැංකු ප්‍රතිපත්ති සමාලෝචනයකට අනුව, 1991 සිට 2001 දක්වා දශකය තුල දිලිඳු බවේ ජීවත් වූ වතු කම්කරුවන් ප්‍රමානය සියයට 50කින් ඉහල ගියේ ය. පවුල් ලක්ෂ 17ක් ජීවත් වන්නේ ආන්ඩුවේ සමෘද්ධි වැඩ පිලිවෙල යටතේ එක් පවුලකට ලැබෙන මසකට රුපියල් 500ක (ඩොලර් 5) හෝ ඊටත් අඩු මුදලක් මත ය.

* මිලියන 19ක් වන රටේ ජනගහනයෙන් සියයට 15.4ක් ජීවත් වන්නේ "නිවාස" ලෙස අමාරුවෙන් වර්ගීකරනය කල හැකි වරිච්චි මැටි පැල්පත්වල, නැත හොත් පොල් අතු පැල්පත්වල බව 2003/2004 *පාරිභෝගික මූල්‍ය සමීක්ෂන වාර්තාව* කියා සිටී. නල ජල පහසුකම් ඇත්තේ ජනතාවගෙන් සියයට 31කට පමනි. ජනගහනයෙන් හතරෙන් පංගුවකට විදුලි බල පහසුකම් නැත.

" දශක දෙකක යුද්ධය දැවැන්ත විනාශයක්, විශේෂයෙන් ම උතුරු-නැගෙනහිර යුද්ධ කලාපය තුල, ඇති කර තිබේ. 2002 වසරේ අත්සන් කෙරුනු සටන් විරාමය තිබිය දී ම, 800,000ක් ජනයා සිය රට තුල අවතැන් වූවන් බවට පත්ව ඇතැයි ද 172,000ක් තව මත් අනාථ කඳවුරුවල ජීවත් වන බවට ද ගනන් බැලෙයි. කාන්තාවන් 30,000ක් පමන යුද්ධයෙන් වැන්දඹුවන් බවට පත් කරනු ලැබ සිටිති.

## කම්කරු පන්තිය සඳහා සමාජවාදී ක්‍රියා මාර්ගයක්

සසපය ඉදිරිපත් කර සිටින්නේ, තුනී සුලුතරයක් සඳහා ලාභ නිර්මානය කිරීම හා දැවැන්ත පෞද්ගලික ධන සම්පත් කඳු ගසා ගැනීම වෙනුවට සමස්තයක් වසයෙන් ජනතාවගේ මානව අවශ්‍යතා සන්තර්පනය කිරීම තම

සංවිධානමය මූලධර්මය කර ගන්නා වූ ආර්ථික ක්‍රමයකි. එවන් සමාජ ප්‍රතිවර්තනයක් උදෙසා ආර්ථික පදනම් දැමීම ආරම්භ කරනු වස්, සියලු විශාල බැංකු හා මූල්‍ය ආයතන ජනසතු කිරීම ද නිදහස් වෙළඳ කලාපවල ක්‍රියාත්මක වන ඒවා ද ඇතුලු මහා පරිමාන කාර්මික හා නිෂ්පාදන සංගත සියල්ල පොදු ජන අයිතියට හා පොදු ජන පාලනයට යටත් ව්‍යවසායන් බවට පරිවර්තනය කිරීම ද සියලු ම තීරනාත්මක ස්වාභාවික සම්පත් පොදු අයිතිය සහ පාලනය යටතේ තැබීම ද අවශ්‍ය බව අපි අවධාරනය කර සිටිමු.

### * සියලු දෙනාට ම සුරක්ෂිත හා මනා වැටුප් සහිත රැකියා

වත්මන් ආර්ථික පර්යායට විරැකියාව ආවේනික වේ. 2003-2004 වර්ෂයේ දී විරැකියාව සියයට 8.9කින් වැටුනු බවට ආන්ඩුව පුරසාරම් දොඩයි. එහෙත් නිල සංඛ්‍යා ලේඛන සැබෑ තත්වය අඩුවෙන් තක්සේරු කිරීම පිලිබඳව කුප්‍රකට ය. ඌන රැකියා නියුක්තිය සියයට 21.6කි. තරුනයන් අතර විරැකියාව පැතිර පවතී. වයස 15 හා 18 අතර වූවන්ගෙන් සියයට 36කට රැකියාවක් ඇත්තේ ම නැත. 19-24 අතර වයස්වල අයගෙන් සියයට 30කට රැකියා නැත. උසස් පෙල සමත් වූවන් ද උපාධිධාරීන් ද අතර සියයට 18.2කට රැකියා නැත. මේ අතර වයස 5-17 දක්වා වූ මිලියනයකට ආසන්න ලමුන් ප්‍රමානයක් දිලිඳු බවේ ගැලුනු තම පවුල්වලට ආධාර වීම සඳහා කිසි යම් රැකියාවක නියුක්ත වෙයි. ඉන් අඩක් ම වයස 15ට අඩු අය ය. එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා ප්‍රදේශ ගනනට ගත හොත් මෙම සංඛ්‍යා ලේඛන තව දුරටත් ඉහල නගිනු ඇත.

රාජපක්ෂ සහ වික්‍රමසිංහ යන දෙදෙනා ම රැකියා නිර්මානය කිරීමට පොරොන්දු දෙති. 2002-2004 සමයේ රාජ්‍ය අංශයේ රැකියා නිර්දය ලෙස වනසා දැමූ වික්‍රමසිංහ මීලඟ දශකය තුල වසරකට රැකියා 200,000ක් බැගින් නිර්මානය කිරීමට දිවුරුම් දෙයි. ඒ අනුව මුලුමනින් ම රැකියා ලක්ෂ 20කි. ඊට පරදින්නට සූදානම් නැති රාජපක්ෂ ඉදිරි සය වසර තුල රැකියා ලක්ෂ 24ක් නිර්මානය කිරීමට පොරොන්දු දෙයි. 2004 මැතිවරනයට පෙර ඔහුගේ සන්ධානය ප්‍රකාශ කලේ, තමන් සරසවිවලින් හා උසස් විද්‍යාලවලින් සමත් වූවන්ට රැකියා 100,000ක් සපයන බව යි. මේ වන විට එම ආන්ඩුව සමත් වී තිබෙන්නේ ස්ථිර රැකියා 32,000ක් සම්පාදනය කිරීමට පමනකි.

සතියක වැඩ පැය ගනන 30කට අඩු කර එහෙත් වැටුප් නො කපා රැකියා ගනන වැඩි කිරීමට සසපය යෝජනා කර සිටී. පොදු කාර්ය වැඩ පිලිවෙලක් සඳහා රුපියල් බිලියන ගනනින් යොදවා එමගින් මනාව වැටුප් ගෙවන රැකියා ලක්ෂ ගනනක් නිර්මානය කර ගත යුතු ය. එවන් වැඩ පිලිවෙලක් මගින් වහා ම අවශ්‍යව පවත්නා පොදු නිවාස, පාසල්, රෝහල්, මාවත් සහ ජල සම්පාදන වැඩ පිලිවෙලවල් ගොඩ නැගිය යුතු ය. සුනාමියෙන් ද දශක දෙකක් පුරා පැවති සිවිල් යුද්ධයෙන් ද විනාශභාග් වූ ජීවිත යලි ගොඩ නැගීමට ක්ෂනික ප්‍රමුඛත්වය දිය යුතු ය.

බඩු මිල රොකට් වේගයෙන් ඉහල නගින තතු තුල මූර්ත (සැබෑ) ආදායම් පහලට ඇද වැටේ. 2000 සිට ගතව ඇති පස් වසර තුල වතු කම්කරුවන්ගේ මූර්ත වැටුප් සියයට 14කින් ද වානිජ හා කාර්මික අංශවල කම්කරුවන්ගේ මූර්ත වැටුප් සියයට 34කින් ද ඇද වැටී තිබේ. සියලු ම කම්කරුවන්ගේ අවම මාසික වැටුප රුපියල් 10,000 (දල වසයෙන් ඩොලර් 100) මට්ටමට වහා ම ඉහල දැමිය යුතු යැයි සසපය යෝජනා කරයි. එතැන් පටන් ඉහල යන ජීවන වියදමට අනුව වැටුප් ද වැඩි කල යුතු ය.

සියලු ආකාරයේ ලමා ශ්‍රමය සහ රාත්‍රි වැඩ මුරවලට තරුනයන් හා කාන්තාවන් යොදා ගැනීම අවසන් කල යුතු යැයි අපි කියා සිටිමු. තම ශක්‍යතා වර්ධනය කර ගැනීම සඳහා සියලු තරුන ජනයාට ආන්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිලිවෙලක් මගින් මනා වැටුප් සහිත වෘත්තීය පුහුනුවක් ලබා දිය යුතු ය. මනා හා ප්‍රමානවත් උපකරනවලින් යුක්ත සංස්කෘතික හා ක්‍රීඩා පහසුකම් ද මොවුනට සපයා දිය යුතු ය.

### * ගුනාත්මකව ඉහල නිදහස් අධ්‍යාපනයක් උදෙසා

සෑම තරුන පුද්ගලයෙකුට ම ඔහුගේ හෝ ඇගේ නිපුනතා හා කුසලතා පූර්නව වර්ධනය කර ගැනීම සඳහා ඉඩ සැලැස්විය යුතු ය. අධ්‍යාපන පද්ධතිය අසමානතාව විසින් ඉරා දමනු ලැබ ඇත. කම්කරු පන්තික සහ පිටිසර ප්‍රදේශවල දරුවන් ගුරු හිඟයෙන්, උපකරන හිඟයෙන් පීඩා විඳින රජයේ පාසල්වලට ගාල් කරනු ලබන අතර පොහොසතුන්ගේ දූ පුත්තු මුදලට ගත හැකි දියුනු ම සම්පත්වල, විධික්‍රමවල හා තාක්ෂනයේ සකල වාසි භුක්ති විඳිති.

වතු කම්කරුවන්ගේ දරුවන් අතර, සියයට 20කට පාසල් පහසුකම් නැත. තවත් සියයට 44කට ලැබෙන්නේ ඉතා නොදියුනු ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපනයක් පමනි. සමස්තයක් වසයෙන් ගම්බද ප්‍රදේශවල, දරුවන්ගෙන් සියයට 30කට ලැබෙන්නේ ප්‍රාථමික අධ්‍යාපනය පමනි. එහෙත් 1997-2004 දක්වා කාල පරිච්ඡේදය තුල දී තවත් රජයේ පාසල් 592ක් වසා දමන ලද අතර පුද්ගලික පාසල් සංඛ්‍යාව 125කින් ඉහල ගියේ ය. පසු ගිය වර්ෂයේ ශිෂ්‍යයන් 110,000ක් සරසවි අධ්‍යාපනයට සුදුසුකම් ලද නමුත් සරසවිවලට ඇතුලු වීමට වරම් ලද්දේ 16,500ක් දෙනා පමනි.

සිය අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යාමට අවශ්‍ය සියලු දෙනාට ම, සරසවි මට්ටම දක්වා හා එය ද

ඇතුලත් වන පරිදි නිදහස්, ගුනාත්මකව ඉහල මට්ටමේ අධ්‍යාපනයක් සම්පාදනය කරනු පිනිස පොදු අධ්‍යාපන පද්ධතිය ඉමහත් ලෙස ප්‍රසාරනය කල යුතු යැයි සසපය යෝජනා කරයි. විද්‍යාගාර, පරිගනක පහසුකම් සහ නවතම ශ්‍රව්‍ය-දෘශ්‍ය අධ්‍යාපන විධික්‍රම මෙන් ම ක්‍රීඩා හා කලා පහසුකම් ද සම්පාදනය කරමින් පවත්නා පාසල්වල හා ආයතනවල තත්වය උසස් කල යුතු ය.

### * සාර්වත්‍රික සෞඛ්‍ය සේවාවක් හා මනා සුභසාධන වැඩ පිලිවෙලක්

වෛද්‍ය විද්‍යාවේ විප්ලවීය වෙනස්කම් ඇති වී තිබෙන නමුත් දහස් ගනන් ශ්‍රී ලාංකිකයෝ සෑම වසරක් පාසා ම වැලැක්විය හැකි රෝගවලින් මරනයට පත් වෙති. මැලේරියාව, කම්මුල්ගාය සහ ක්ෂය රෝගය වරෙක මුලුමනින් ම තුරන් කර දමන ලදැයි සලකන ලද නමුත් දැන් යලිත් ඉහල නගිමින් පවතී. මුදල් වියදම් කල හැකි අය පමනක් පෞද්ගලික වෛද්‍යවරුන් හා සායන වෙත යන අතර එසේ කර ගත නොහැකි බහුතරයට සිදු වී ඇත්තේ වියදම් කප්පාදුවට භාජන වී ඇති රජයේ රෝහල් පද්ධතිය වෙත යාමට ය. බොහෝ දෙනෙකුට නිර්දේශ කෙරෙන ඖෂධ සඳහා වන වියදම් දරා ගත නොහැකි ය. දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සෞඛ්‍යය සඳහා රජයේ වියදම 1997 දී 2.3ක සිට 2004 දී 1.4ක් දක්වා වැටී තිබේ.

සෑම කෙනෙකුට ම නොමිලේ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් සම්පාදනය කරනු පිනිස මනාව සජ්ජිත වූ ද ප්‍රමානවත් කාර්ය මන්ඩලයකින් යුක්ත වූ ද රජයේ රෝහල් හා සායන පද්ධතියක් වර්ධනය කිරීමේ තීව්‍ර වැඩ පිලිවෙලක් අවශ්‍ය යැයි සසපය කියා සිටී.

දිලිඳුකම ද ප්‍රමානවත් පරිදි ආහාර නොලැබීම ද පුලුල්ව පැතිර පවතී. 2002 ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවකට අනුව, වයස අවුරුදු 5ට අඩු දරුවන් අතර මන්දපෝෂනය උතුරු-නැගෙනහිර යුද්ධ කලාපය තුල සියයට 46.2කි, සමස්තයක් ලෙස මුලු දිවයිනේ ම සියයට 29.4කි. මාතෘ මන්දපෝෂනය ද නිදන්ගතව පවතී. දැනට පවත්නා සීමාසහිත පෝෂන වැඩ පිලිවෙල දේශපාලන අරමුනු සඳහා පලල් ලෙස අපචාරයට ලක් කරනු ලැබ ඇත. ඒ වෙනුවට, සියලු දෙනාට ප්‍රමානවත් ආදායමක් සහතික කෙරෙන පරිද්දෙන් සාර්වත්‍රික සුභසාධන සහ විශ්‍රාම වැටුප් ක්‍රමයක් ස්ථාපනය කල යුතු ය.

### * සියලු පවුල්වලට යහපත් නිවාස

බොහෝ පවුල් ජීවත් වන්නේ නල ජලය, විදුලිය සහ සුදුසු වැසිකිලි වැනි ඉතා මූලික පහසුකම්වලින් තොර පහත් තත්වයේ නිවාසවල ය. ගෙවල් කුලී ඉහල නැග ඇත්තේ, යහපත් නිවාසයක ජීවත් වීම පලල් මහජනතාවට කර ගත නොහැකි තත්වයක් උද්ගත කරමිනි. සුනාමියේ ප්‍රතිඵලයක් ලෙස දසදහස් ගනන් ජනයාට තමන්ගේ නිවාස මුලුමනින් ම අහිමි වී තිබේ. කොලඹ නගරය තුල ජනගහනයෙන් සියයට 51ක් ජීවත් වන්නේ මුඩුක්කුවල ය. මීට ආන්ඩුවේ ප්‍රතිචාරය වී ඇත්තේ දුප්පත් ජනයා මුඩුක්කුවලින් එලවා දමා මහා ජාවාරම්කරුවන්ට එම ඉඩම් ලබා දීම ය.

සියලු පවුල්වලට දැරිය හැකි මිලකට යහපත් නිවහන් ලබා දීම පිනිස, අත්‍යවශ්‍ය පහසුකම් සියල්ලෙන් සමන්විත පොදු නිවාස ඉදි කිරීමේ වැඩ පිලිවෙලක් අවශ්‍ය යැයි සසපය කියා සිටී. දුෂ්ට නිවාස හිමියන්ගේ ලාභ ගැරීම වලකා ලනු පිනිස ගෙවල් කුලී පාලන ක්‍රමයක් ඇති කොට එය මනාව ක්‍රියාත්මක වීම නිරතුරුව සිදු කෙරෙන තත්වයක් ඇති කල යුතු වේ. හිස් ගෙවල් හා තට්ටු නිවාස දුප්පත් පවුල්වලට නාමික කුලියකට ලබා දිය යුතු ය.

### * කාන්තා කම්කරුවන් පීඩාවට පත් කිරීම අවසන් කරනු

කාන්තා කම්කරුවෝ කම්කරු පන්තියේ ඉතා ම පීඩිත කොටස් අතරට වැටෙති. දරිද්‍රතාව විසින් අඩු වැටුප් ද ගෙවල්වල කැඹිරීම ද යන දෙගුනයක් බර ඔවුන්ගේ කර මතට දමා තිබේ. සාමාන්‍යයෙන් ඇඟලුම් කර්මාන්තයේ ද තේ දලු නෙලීමේ ද රබර් කිරි කැපීමේ ද වෙනත් ආකාර කෘෂිකාර්මික වැඩ කටයුතුවල ද ඉතා මත් බර වැඩි අංශය සිරිතක් වසයෙන් වැටී ඇත්තේ ද කාන්තාවන් මත ය. එහෙත් ගැහැනියකට ලැබෙන සාමාන්‍ය වැටුප තේ කර්මාන්තයේ දී නම් පිරිමියෙකුගේ මෙන් සියයට 71කි, රබර් කර්මාන්තයේ දී සියයට 75කි, වී ගොවිතැනේ දී සියයට 78කි.

භූගෝලීයකෘත නිෂ්පාදනයේ ඉතා මත් පැහැදිලි ප්‍රතිවිපාකය නම් දැන් 300,000කට අධික ජනකායක් රැකියාවේ යොදා ඇති ඇඟලුම් කර්මාන්තය යි. මේ අය අතුරෙන් වැඩි ම කොටස දිලිඳු පිටිසර ප්‍රදේශවලින් එන තරුන ගැහැනු ලමයි වෙති. නිදහස් වෙලඳ කලාපවල මොවුන්ට වැඩ කිරීමට සිදු වී ඇත්තේ නම්‍ය (වැඩ පැය ගනන වැඩි කල හැකි) වැඩ දිනයක් සඳහා දිනකට ඩොලර් 2කට (රුපියල් 200කට) අඩු වැටුපක් ලබමින් අප්‍රසන්න වාතාවරනයක් තුල ය. ඔවුන් ජීවත් වන්නේ සෑහෙන පහසුකම් නැති පහත් මට්ටමේ නිවාසවල ය. පෙර පැවති ජාත්‍යන්තර කෝටා ක්‍රමය මෙම වසර තුල දී අවසන් වීම මෙම තරුන ගැහැනු ලමයින් බොහෝ දෙනෙකු තමන්ගේ ගම්වලට ආපසු යවා මීටත් වඩා කාලකන්නි තත්වයන්ට ඇද දැමීමේ තර්ජනය මතු කරයි.

තමන්ගේ පවුල්වලට ආදායමක් ලබා දීම සඳහා ද තමන්ගේ දරුවන්ගේ මනා අධ්‍යාපනය සඳහා ද ලක්ෂ ගනන් කාන්තාවෝ ගෘහ සේවිකාවන් හැටියට හෝ

වඩාත් පහල මට්ටමේ රැකියා සඳහා හෝ මැද පෙරදිගට යති. එහි දී ඔවුහු සිය හාම්පුතුන්ගේ හිරිහැරයන්ට නිරතුරුව ම ලක් වෙති. මෙම කම්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා, ඔවුන් සැක කටයුතු ලෙස මරනයට භාජන වූ තතු තුල පවා, ඇඟිල්ලක් වත් එසවීමට මෙතෙක් පැවති කුමන ආන්ඩුවක් හෝ සමත් වී නැත. කොලඹ පාලකයන්ගේ ප්‍රධාන උත්සුකය වී ඇත්තේ වර්තමානයේ රටේ විශාලතම විදේශ විනිමය ඉපැයුම් මාර්ගය වන මෙම නූතන වහල් වෙලඳාමට හානි නොවන අයුරින් වැඩ කිරීම ය.

සමාන වැටුප් ද නොමිලේ දරුවන් රැක බලා ගැනීමේ මනා පහසුකම් හා පූර්න වැටුප් සහිත මාතෘ නිවාඩු ඇතුලුව යහපත් සේවා කොන්දේසි ද සඳහා කාන්තා කම්කරුවන්ට ඇති අයිතීන් ආරක්ෂා කිරීමට සසපය ක්‍රියා කරයි. ඔවුන් දෙවන මට්ටමේ පුරවැසියන් බවට පත් කරන්නා වූ විවාහ නීති ඇතුලු කාන්තාවන්ට එරෙහි සකල ආකාර වෙනස්කම් නීති විරෝධී කල යුතු යැයි අපි කියා සිටිමු. ගබ්සා කිරීම නීත්‍යානුකූල කොට සියලු කාන්තාවන්ට එම අවශ්‍යතා නිදහසේ ඉටු කර ගත හැකි තත්වයක් ඇති කල යුතු ය. ශතවර්ෂ ගනනාවක බන්ධනකාරී සම්ප්‍රදායක් නීතිමය පියවර මගින් පමනක් අහෝසි කර දැමිය නොහැකි බව සත්‍ය ය. එහෙයින් ම මිනිසුන්ට හා ගැහැනුන්ට එක සේ තමන්ගේ කුසලතා හා පෞරුෂය පූර්න ලෙස වර්ධනය කල හැකි ප්‍රබුද්ධ සංස්කෘතික වාතාවරනයක් නිර්මානය කිරීමට සසපය නිසැකව ම සටන් වදී.

### * කුඩා ගොවීන් ඇද වැටී සිටින තත්වයෙන් ගොඩ ගනු

ඉඩම් අවශ්‍යතාව රට පුරා වඩ වඩාත් උග්‍ර තත්වයට පත්ව තිබේ. නිල සංඛ්‍යා ලේඛන අනුව, ගොවීන්ගෙන් අතිමහත් බහුතරයක්, එනම් සියයට 72ක්, සීමා වී ඇත්තේ හෙක්ටෙයාර් 1.6 නොඉක්මවන ඉඩම් කට්ටිවලට ය. මින් සියයට 7කට ආසන්න ප්‍රමානයකට බිම් අඟලක් වත් නැත. එජාපය ද පොදු පෙරමුන ද යන දෙගොල්ල ම ඉඩම් නැති සිංහල දුප්පත් ජනයා මුහුන දී සිටින අර්බුදය ගසා කමින් ඔවුන්, උතුරේ වන්නි ප්‍රදේශයේ හා නැගෙනහිර, ප්‍රධාන වසයෙන් ම දෙමල ප්‍රදේශවල පිහිටි ගොවි ජනපදවල හිතාමතා ම පදිංචි කර තිබේ. මෙය වාර්ගික ආතතීන් උග්‍ර කිරීමට සේවය කල පිලිවෙතකි.

නිෂ්පාදන වියදම් ඉහල යන නමුත් කෘෂි නිෂ්පාදනවල මිල තියුනු ලෙස පහල බසින තතු තුල දිලිඳු ගොවීහු සෑම තැනක ම "කතුරු අර්බුදයකට" හසු වී සිටිති. වික්‍රමසිංහ පාලනය විසින් කප්පාදු කර දමනු ලැබූ පොහොර සහනාධාර, 2004 දී කුමන මැතිවරන පොරොන්දු දුන්නත් රාජපක්ෂ පාලනය යටතේ මුලුමනින් ම ආපසු ලබා දී නැත. ගොවීන්ගේ නය දඟරාකාරව ඉහලට ම නගිමින් පවතී. ප්‍රධාන රාජ්‍ය බැංකුවලට තිබෙන නය 2000-2004 අතර ආසන්න වසයෙන් දෙගුනයක් වී ඇත. තෙතමනයක් නැති පොලීකාරයෝ ද අතරමැදියෝ ද මීටත් වඩා වැඩි කුට්ටියක් උදුරා ගනිති. නය ඉහල යන තතු තුල ගොවියාගේ මූල්‍ය තත්වය වඩ වඩාත් වියරු බවට පත් වේ. සෞඛ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යා ලේඛන අනුව ගම්බද වී ගොවිතැන් කරන ප්‍රදේශවල සිය දිවි හානි කර ගැනීම් සංඛ්‍යාව 2000 වර්ෂයේ දී ලක්ෂයකට 34.33ක් වූ අතර 2004 දී මෙය ලක්ෂයකට 35.91 දක්වා ඉහල නැග ඇත.

ජනවර්ගය නො තකා සියලු ඉඩම් නැති ගොවීන්ට රජයේ ඉඩම් ලබා දිය යුතු යැයි සසපය කියා සිටී. දුප්පත් ගොවීන් හා ධීවරයන් මත පැටවී ඇති පැරනි නය කන්දරාව අහෝසි කල යුතු ය. දුප්පත් ගොවියන් අතට බැංකු නය ද කෘෂි උපකරන ද පොහොර ද රසායන ද්‍රව්‍ය ද ධීවරයන්ට ධීවර ආම්පන්න ද පහසු කොන්දේසි මත සම්පාදනය කල යුතු ය. පොහොර වැනි කෘෂිකර්මයට අවශ්‍ය ද්‍රව්‍යවල සහනාධාර යලිත් තහවුරු කොට වැඩි කල යුතු ය. ගොවි පවුල්වලට යහපත් ජීවන තත්වයක් සහතික කර දීම සඳහා කෘෂි නිෂ්පාදනවලට සහතික මිලක් නියම කල යුතු ය.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනතාව උදෙසා

ලාභ ගරන පද්ධතියට එරෙහිව ප්‍රතිප්‍රහාරයක් සඳහා අත්‍යවශ්‍ය පූර්ව-කොන්දේසිය වන්නේ කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය යි. සිය අරගල ඒකාබද්ධ කරමින්, සියලු දෙනාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරමින් සහ දිලිඳුකම හා අගහිඟකම් අවසන් කිරීමට තමන්ගේ ම සමාජවාදී විසඳුම ඉදිරිපත් කරමින්, කම්කරු පන්තිය ඉදිරිපත් වේ නම් එම පන්තිය නාගරික හා ගම්බද දුප්පත් ජනතාවගෙන් සමන්විත පීඩිත ජනයා තමන් වෙත ආකර්ෂනය කර ගනිමින් දේශපාලන බලය අල්ලා ගැනීමේ බලගතු ව්‍යාපාරයකට මුල පුරා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් ගොඩ නගා ගැනීමට සමත් වනු ඇත.

කම්කරුවන්ට තමන්ගේ අවශ්‍යතා සඳහා සටන් කිරීමට නව මහජන පක්ෂයක් අවශ්‍යව තිබේ. කම්කරු පන්තියේ පැරනි සංවිධාන -- ලංකා සමසමාජ පක්ෂය (ලසසප), කොමියුනිස්ට් පක්ෂය (කොප) සහ වෘත්තීය සමිති -- කිසිදු වැදගැම්මකට නැති ඒවා බව තහවුරුව ඇත. 1960 ගනන්වල දී, 1970 ගනන්වල දී සහ යලිත් 1990 ගනන්වල දී ධනපති ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් හවුල් ආන්ඩුවල කොටස්කරුවන්ව සිටි ලසසපය හා කොපය දැන් ක්‍රියාත්මක වන්නේ, ශ්‍රීලනිපයේ අභ්‍යන්තර කන්ඩායමකට නොවෙනස් ලෙස ය. 1950 ගනන් හා 1960 ගනන්වල දී කම්කරුවන් හා ගම්බද

දුගීන් අතර පලල් අනුගාමිකත්වයක් දිනා සිටි ලසසප 2004 මැතිවරනයේ දී එක් ආසනයක් වත් දිනා ගැනීමට අසමත් වූ අතර එම පක්ෂයට පාර්ලිමේන්තුවේ තැනක් යන්තම් ලබා ගත හැකි වූයේ ශ්‍රීලනිපය විසින් ලබා දෙන ලද ජාතික ලැයිස්තු ආසනයේ පිහිටෙනි. ජවිපෙ හා හෙල උරුමය සමග රාජපක්ෂ ඇති කර ගෙන තිබෙන ගිවිසුම් ගැන සැකසංකා පල කර ඇති නමුත් ලසසපය හා කොපය යන දෙක ම ඔහුගේ අපේක්ෂකත්වයට සහාය පල කර ඇත.

ආරම්භයේ පටන් ම, ජවිපෙ පදනම් වූයේ සිංහල ගම්බද තරුනයන්ගේ අතෘප්තියට පත් ස්ථරයන් මත මිස කම්කරු පන්තිය මත නො වේ. 1990 ගනන්වල දී ලසසපයට හා කොපයට පැවති සහාය බිඳ වැටුනු කල්හි සටන්කාමිත්වයට කෙරුනු පුහු ආයාචන මගින් ද ජනතාවාදී හිස් ගෝසා මගින් ද වෘත්තීය සමිති පදනමක් තනා ගැනීමට ජවිපෙට ඉඩ ලැබුනි. එහෙත් ජවිපෙ නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති අනෙක් වෘත්තීය සමිතිවලට වඩා අමුතු ඒවා නොවන බවට දැන් ඔප්පු වී ඇත. ඔවුහු ද කම්කරුවන්ගේ උවමනාකම් ධනේශ්වර පද්ධතියේ සීමාබන්ධනයන්ට බිලි දීමට සූදානම් ය. එපමනක් නො ව සිය සමාජවාදී හඬ තැලීම් මුලුමනින් ම පාගේ අත හැර දමා සිටින ජවිපෙ, ආන්ඩුවට සහභාගීව බලය පරිහරනයේ දී ප්‍රථම වතාවට උර ගා බලනු ලැබ ඇත. 2004 මැතිවරනයේ දී එජාපයට හා ශ්‍රීලනිපයට විකල්පයක් ලෙස ජවිපෙට ඡන්දය දුන් උදවියගේ බලාපොරොත්තු සුන් වී තිබේ. රාජපක්ෂ ආන්ඩුවේ ද කෘෂිකර්ම හා ධීවර ඇමති තනතුරු දැරූ තමන්ගේ ම ඇමතිවරුන්ගේ ද පරාගත ආර්ථික පිලිවෙත් පිලිබඳව ඍජු වගකීමක් ජවිපෙ දරා සිටී.

තමන්ගේ ආධාර පදනම දිය වී යන තතු තුල ජවිපෙ වඩ වඩාත් උග්‍රව සිංහල ජාත්‍යොත්තමවාදය දෙසට හැරී ගෙන සිටී. සුනාමි ආධාර බෙදීමට එල්ටීටීඊය සමග ඒකාබද්ධ යාන්ත්‍රනයක් ඇති කර ගැනීමට එරෙහිව දක්ෂිනාංශික හෙල උරුමය ද සමග එක්ව ජවිපෙ යෙදී සිටින දුෂ්ට ව්‍යායාමය, සිංහල දකුනු පලාත්වල සුනාමියෙන් විපතට පත් ජනයා උතුරු-නැගෙනහිර පලාත්වල එයින් විපතට පත් දෙමල හා මුස්ලිම් ජනයා සමග කෙටවීමට හොඳට ගනන් බලා දරන ලද ප්‍රයත්නයක් විය. ජූනි මාසයේ දී ආන්ඩුව හැර ගියාට පසුව ජවිපෙ පී-ටොම්ස් එකඟතාව ද සටන් විරාමය ද ජාතිය "පාවා දීමක්" ලෙස හෙලා දැකීමේ සිය ව්‍යාපාරය උත්සන්න කර තිබේ. දැන් එය ගෙන යමින් සිටින ෆැසිස්ට් වර්ගයේ ප්‍රචාරය අපට මතක් කරන්නේ 1980 ගනන් අග දී ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව එය යෙදී ගත් උද්ඝෝෂනය යි. එකල ජවිපෙ මැර කල්ලි ඔවුන්ගේ විරෝධතාවන්ට හා වර්ජනයන්ට සහාය දීම ප්‍රතික්ෂේප කල කම්කරුවන්, වෘත්තීය සමිති නිලධාරීන් හා දේශපාලන විරුද්ධවාදීන් ද දුසිම් ගනන් මරා දැමී ය.

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුන (ප්‍රවාපෙ), නව සමසමාජ පක්ෂයේ (නසසප) නව වාමාංශික පෙරමුන (නවාපෙ) සහ එක්සත් සමාජවාදී පක්ෂය (එසප) වැනි විවිධ සුලු ධනේශ්වර රැඩිකල් සංවිධාන ද කම්කරු පන්තිය විසින් ප්‍රතික්ෂේප කල යුතුව ඇත. මෙම කන්ඩායම්වල ප්‍රධාන ගුනාංගය වන්නේ, ඒවායේ ජාතිකවාදය හා අවස්ථාවාදය යි. කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීම සඳහා වූ සප්‍රතිපත්තික දේශපාලන අරගලයකට ඓන්ද්‍රීයව සතුරු වූ මෙම "සමාජවාදී" පක්ෂවලට ප්‍රධාන ධනේශ්වර පක්ෂ සමග දේශපාලන උපාමාරුවල යෙදී ගැනීමේ දීර්ඝ හා කාලකන්නි ඉතිහාසයක් පවතී.

මෙම මැතිවරනයේ දී, ප්‍රවාපෙ විවෘතව ම රාජපක්ෂට සහාය දෙයි. නවාපෙ සහ එසප ඊට වඩා තරමක වෙනස් පිලිවෙතක් අනුගමනය කරයි -- ඔවුහු තමන්ගේ ම ජනාධිපති අපේක්ෂකයන් ඉදිරිපත් කර සිටින නමුත් තමන් "අඩු නපුර" හැටියට සලකන්නේ වික්‍රමසිංහ බව අඟවති. මෙම පක්ෂ දෙක ම ඊනියා සාම ක්‍රියාවලියේ අවිවේචනාත්මක අද්වකාත්ලා ලෙස ක්‍රියා කරන අතර මහ ව්‍යාපාරිකයන් සහ ප්‍රධාන ලෝක බලවතුන් විසින් ඉදිරියට තල්ලු කෙරෙන විවිධ සාම ජාවාරම්වලට මැනවින් ගැලපෙන පරිදි, යුද්ධයට "ෆෙඩරල් විසඳුමක්" ද ඔවුහු ඉල්ලා සිටිති. මොවුන් පුද්ගලීකරනය ද "වෙලඳ පොල ප්‍රතිසංස්කරන" ද විවේචනය කරන්නේ භූගෝලීය ධනවාදය අහෝසි කිරීමේ ආස්ථානයේ සිට නො ව, ජාතික ආර්ථික පරිපාලනය මස්තකප්‍රාප්ත වූ මීට වසර 30කට පෙර කාලය කරා හෝරා යන්ත්‍රය ආපසු කැරකිය හැකි ය යන මනෝරාජික මිථ්‍යාව තොරොම්බල් කිරීමට ය.

## දකුනු ආසියාවේ සමාජවාදය සඳහා අරගලය

සමාජවාදී සමානතා පක්ෂය පදනම් වී ඇත්තේ, අද දින හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තුල ගැබ් වී ඇත්තා වූ, සමානත්මතාව, ජාත්‍යන්තරවාදය සහ මානව වර්ගයා පීඩනයෙන් හා දරිද්‍රතාවෙන් ද්‍රව්‍යමයව හා ආධ්‍යාත්මිකව විමුක්ත කර ගැනීම යන මේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ මහා සම්ප්‍රදායන් මත යි.

1917 දී, විද්‍යාත්මක සමාජවාදයේ ක්‍රියා මාර්ගයෙන් මෙහෙයවුනු මහා ජනතා ව්‍යාපාරයක් රුසියාවේ ධනවාදය පෙරලා දමා සෝවියට් සංගමය පිහිටුවී ය. රුසියානු විප්ලවය වඩාත් පෘථුල ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක කොටසක් වූවාක් මෙන් ම, එම ව්‍යාපාරයට ආස්වාදයක් ද සැපයී ය. එහෙත් වෙනත් රටවල විප්ලවවාදී අරගලවල පරාජය දැවැන්ත පීඩනයන් නිර්මානය කල අතර එම පීඩනය ප්‍රථම කම්කරු රාජ්‍යය හුදෙකලා වීම ද සමග ජෝශප් ස්ටැලින්ගේ නායකත්වයෙන් මර්දනකාරී නිලධර

තන්ත්‍රයක් පැන නැගීම ලෙස ප්‍රකාශනයක් අත් කර ගති. බොල්ෂෙවික් පක්ෂයේ ජාත්‍යන්තරවාදය අත හැර දැමූ ස්ටැලින් "තනි රටක සමාජවාදය ගොඩ නැගීමේ" ප්‍රති-මාක්ස්වාදී ඉදිරි දර්ශනය ඉදිරිපත් කලේ ය.

මෙම ජාතිකවාදී සංකල්පයේ පදනම මත ස්ටැලින්වාදී නිලධරය ඔක්තෝබර් විප්ලවය පාවා දී, කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කොට, සැබෑ මාක්ස්වාදීන් සංහාරය කොට ලෝකය පුරා ම කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල කඩකප්පල් කර දැමී ය. ආසියාව පුරා ම ස්ටැලින්වාදී පක්ෂ ධනේශ්වර පර්යාය රැක දීමෙහි ලා තීරනාත්මක කටයුත්තක් ඉටු කර තිබේ. ධනේශ්වර ජාතිකවාදී සුකර්නෝ සමග ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂය ගෙන ගිය සහයෝගිතාව 1965-66 සීඅයිඒ ආධාර ලත් හමුදා කුමන්ත්‍රනයට මග පෑදී ය. එම කුමන්ත්‍රනය කම්කරුවන් හා කොමියුනිස්ට් පාක්ෂිකයන් පන්ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් ඝාතනයට ලක් කලේ ය. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඅයි) ද ඉන්දියානු කොමියුනිස්ට් (මාක්ස්වාදී) පක්ෂයේ (සීපීඅයි-එම්) ද ස්ටැලින්වාදියෝ ඉන්දියාව තුල තව මත් කොංග්‍රස් පක්ෂයේ කුනු වෙන මල සිරුරට පන පිඹීමට උත්සාහ කරමින් සිටිති. 1991 වන විට ස්ටැලින්වාදයේ ද එය අධිරාජ්‍යවාදය සමග පවත්වා ගෙන ගියා වූ සහයෝගිතාවේ ද ප්‍රතිගාමී තර්කනය කූටප්‍රාප්තියට පත් වූයේ සෝවියට් සංගමය බිඳ දමා ධනවාදය පුනස්ථාපනය කිරීමෙනි. චීනයේ "කොමියුනිස්ට්" නායකත්වය තම පොලිස් රාජ්‍ය යන්ත්‍රය යොදා තම රට ලෝකයේ ඩාදිය කම්හල බවට පත් කොට 19 වන ශතවර්ෂයේ ධනවාදයේ සකල සමාජ නපුරක් ම මහා පරිමානයෙන් ප්‍රතිනිර්මානය කර තිබේ.

අපගේ ව්‍යාපාරය පදනම් වී ගන්නේ සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා අරගලය ඉදිරියට ගෙන ගියා වූ කම්කරු පන්තියේ හොඳ ම, අතිශයින් ම ධෛර්ය සම්පන්න හා දුරදක්නා නියෝජිතයන්ගේ උරුමය මත ය. මෙම සම්ප්‍රදායේ ශ්‍රෙෂ්ඨතම සහේදතාව වූයේ, ස්ටැලින්වාදයේ පාවා දීම්වලට එරෙහි අරගලයට නායකත්වය දුන් සහ 1938 දී හතර වන ජාත්‍යන්තරය පිහිටුවීම මගින් ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ පුනරුද්භවයට පදනම දැමුවා වූ රුසියානු විප්ලවයේ සම-නායක ලියොන් ට්‍රොට්ස්කි ය.

මෙම සිද්ධීහු ශ්‍රී ලංකවේ ද දකුනු ආසියාවේ ද කම්කරු පන්තිය තුල ගැඹුරට මුල් විහිදවූහ. 1940 ගනන්වල දී ස්ටැලින්වාදයට එරෙහිව ලියොන් ට්‍රොට්ස්කි විසින් කරන ලද දේශපාලන අරගලය මත පදනම් වූ ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදීහු ඉන්දු උප-මහාද්වීපයේ කම්කරු පන්තිය හා පීඩිත ජනයා සඳහා ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ඉදිරි දර්ශනයක් වර්ධනය කිරීමට ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ මූලධර්ම යෙදීම මගින් ඉන්දියානු බොල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂය ගොඩ නැගීමෙහි ලා තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කලහ. 1964 ලසසප පාවා දීමෙන් මස්තකප්‍රාප්ත වූ බොල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂය විනාශ කිරීම ආසියාව පුරා ම ස්ටැලින්වාදයේ දිග් ගැසුනු ආධිපත්‍යයට සුලුපටු නොවූ ප්‍රතිපදානයක් ඉටු කලේ ය.

සසපයේ පූර්ව-ප්‍රාප්තිකයා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) 1968 දී පිහිටුවන ලද්දේ, ලසසපයේ ජාතික අවස්ථාවාදයට එරෙහි ඍජු දේශපාලන අරගලයකින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව ලෙස ය. දශක තුනහමාරක් තිස්සේ විකොස සහ සසපය, සකල වර්ගයක ම ජාතෝය්ත්තමවාදයට, වෙනස්කම් කිරීම්වලට සහ පීඩනයට අප්‍රතිහතව විරුද්ධව කම්කරු පන්තියේ හා ගම්බද දුප්පත් ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් වෙනුවෙන් පෙරමුන ගෙන ජාතිකවාදී දේශපාලනයේ අන්තරායන් න්‍යායිකව පැහැදිලි කිරීමට සටන් වැද ඇත.

ශ්‍රී ලංකාවේ ද මුලු මහත් කලාපය පුරා ම ද කම්කරු පන්තිය මුහුන දී සිටින අභියෝගය වන්නේ බොල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂය සහ ලසසපය මුල් වර්ෂවල දී කරන ලද අරගලවලට ජීවය දුන් මහා සමාජවාදී සම්ප්‍රදායන් හා අදහස් පුනර්ජීවනය කොට වර්ධනය කිරීම ය. මෙම කර්තව්‍යය උදෙසා කේන්ද්‍රීය වන්නේ ශ්‍රී ලංකාවේ ද ඉන්දියාවේ ද තීරනාත්මක අරගල ඇතුලු විසි වන ශතවර්ෂය පුරා ජාත්‍යන්තර කම්කරු පන්තියේ මූලෝපායික අත්දැකීම්වල පාඩම් උකහා ගැනීම යි.

සැබෑ සාමයක් ද සමාජය සමාජවාදී පිලිවෙත් ඔස්සේ පරිවර්තනය කිරීමේ ද තීරනාත්මක අත්‍යවශ්‍ය භාවය වටහා ගන්නා සියල්ලන්ගෙන් ම අප ඉල්ලා සිටින්නේ අපගේ ජනාධිපතිවරන ව්‍යායාමයට ක්‍රියාත්මක ලෙස සහයෝගය දෙන ලෙස ය. මෙහි අර්ථය නම් අපගේ අපේක්ෂකයන් ද රැස්වීම් ද ප්‍රසිද්ධියට පත් කිරීමත් අපගේ මැතිවරන සාහිත්‍යය සාකච්ඡා කිරීම හා බෙදා හැරීමත් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අන්තර්ජාල මධ්‍යස්ථානය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සඳහා හැකි තරම් පුලුල් ම ශ්‍රාවකත්වයක් දිනා ගැනීමට කටයුතු කිරීමත් ය.

අන් සියල්ලට මත් වඩා, අපගේ ක්‍රියා මාර්ගය හා ඉදිරි දර්ශනය සමග එකඟ වන්නා වූ සියලු දෙනාට ම අප කියා සිටින්නේ සමාජවාදී සමානතා පක්ෂයට බැඳී කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂය ලෙස සසපය ගොඩ නැගීමට එක් වන ලෙස ය.

©
www.wsws.org